# ගී සඳලුව

Gee... Sandaluwa

සිසිර දිසානායක

# ආලකමන්දුව

"ආයුබෝවන් !

කොහොමද ඉතින් ? මේ පැත්තේ එනවාය කියලා ආරන්චියි ! "

අවුරුදු මාසයේ "ගී සඳළුව" වෙනුවෙන් අප සහන් රන්වල කලාකරුවාණන් දුරකථනයෙන් සම්බන්ධ කරගත්තා. ලයනල් රන්වලයන්ගේ "රන්වල ජන ගී කණ්ඩායම" අවුරුදු කාලයට මව් බිමේ මාධ්‍යවල, රසිකයින්ට නැතිවම බැරි පිරිසක්.

***<u>අයියා අහලා ඇතිනේ කරුණාරත්න අබේසේකර මහත්තයා ගේ පුතා, දිලීප අබේසේකර. ඔයාලගෙන් පස්සේ ආනන්ද විද්‍යාලයෙන් බිහිවුණා තවත් නව පරපුරේ ගීත රචකයෙක් දිලීප.</u>***



"හොඳින් ඉන්නවා අයියේ. අපි එන්නේ සිඩ්නි වල අවුරුදු ප්‍රසංගයකට. එහේ ඉන්න තරුණ අයට අපේ නිර්මාණ කීපයක් පුහුණු කරවලා ඒවා ප්‍රසංගයට ඉදිරිපත් කරන්න කියලයි ඒ අය ඉල්ලලා තියෙන්නේ. "ගම අවුලඤ්ඤං", "මුණ ගැහුණම හායි " හායි " වගේ සින්දු ඉංග්‍රීසි කතාකරන පරිසරයක හැදෙන වැඩෙන අපේ දරුවන්ට දවස් කීපයකින් පුරුදු පුහුණු කරවන එක ඇත්තටම අභියෝගයක්. මේ පුහුණුව වැඩ මුළු කීපයක් විදියට කරන්නයි සූදානම. අපේ ජන ගී ගායනය, රංගනය, නර්ථනය විතරක් නෙවෙයි කථනය වගේ දේවල් කොහොමත් ලංකාවේ තියෙන් අපේ වැඩ මුළුවලත් කෙරෙනවාවේ. ඒ වගේම දෙයක් තමයි කරන්න හිතාගෙන ඉන්නේ ."

"හොඳ ආරන්චියක් ඒක. මේ පැත්තෙත් ඔය වගේ දෙයක් සංවිධානය කෙරෙනවානම් හරි වටිනවා මට හිතෙන්නෙ. ඉතින් කොහොම ද ලංකාවෙ මල්ලිලගෙ වැඩ කටයුතු ? "

"අයියත් දන්නවනේ අපේ "ත්‍රී" ප්‍රසංගය ගැන. ඉතින් ඔයාලත් දායකවෙලා කරපු අළුත්ම සින්දු ටිකත් එක්ක මේ දවස් වල අපි "ත්‍රී" ප්‍රසංගයෙන් අළුත්ම දේවල් ටිකක් කරනවා. "ත්‍රී" සංගත තැටියටත් ප්‍රතිචාර බොහොම හොඳයි ....."

"අපි අද අපේ "ගී සඳළුව" වෙනුවෙන් මොනවගේ දෙයක් ගැන ද කතාකරන්නෙ ?"

"අපි ආලකමන්ද ගීතය ගැන කතා කරමු. මොකද ඒක අළුත් වැඩක් !"

"තාත්තා ඉන්න කාලෙ "කරාටේ ජෝ" කියලා චිත්‍රපටියකට සංගීතය අධ්‍යක්ෂණය කරන්න ලැබුණා. චිත්‍රපටියේ නම ඒ විදිහේ වුණාට පසුබිම් ගායනා කළේ අමරදේව තුමා සනත් නන්දසිරි මහත්තයා වගේ අය. අමරදේව තුමාගේ ගීතයට තාත්තා සංගීත නිර්මාණය කළේ තමන්ගේම නිර්මාණයක් විදියට වුණත් සනත් නන්දසිරි මහත්තයාට නිර්මාණය කරපු ගීතය අපේ ජන ගී නාදමාලා ඇසුරින් කරපු තනුවක්. ඒ චිත්‍රපටිය ප්‍රේක්ෂකයෝ අතරට නොගිය නිසා මේ ගීත ගැන වැඩි දෙනෙක් දන්නෙ නෑ. ඉතින් මටත් හිතුණා ජන ගී නාදමාලා ඇසුරින් චිත්‍රපට ගීයක ආරයේ ගීතයක් නිර්මාණය කරන්න."

"ඉතින් අපේ ජන ගී වල එන " කුමාරිහාමි කවි", "තලමල කවි", "හඟලේ යැදීම" වගේ ගායනා ඇසුරින් මම තනුවක් නිර්මාණය කළා." සහන් නිතරම තමන්ගේ පියාණන් වන දිවංගත ලයනල් රන්වලයන් ගුරුකොට ගෙන ඒ මඟ යන්නට උත්සාහ කරන තරුණ නිර්මාණ කරුවෙක්.

"තාත්තා වගේම මමත් හිතුවා මේ ගීතයට අපේ කණ්ඩායමෙන් පිට ගායන ශිල්පීන් යොදගන්න. අයියට මතක ඇතිනේ තාත්තාගේ මුල් නිර්මාණවලට සනත් නන්දසිරි, ටී. එම්. ජයරත්න, බන්ධුල විජේවීර, සමන් ද සිල්වා, රොඩ්නි වර්ණකුල වගේ ප්‍රවීණ අය දායක වුණා. මේ ගීයට උරේෂා රවිහාරි කියන අපේ ජනප්‍රිය ගායිකාවයි, සුපර් ස්ටාර් තරඟ වලින් ජනප්‍රිය වෙලා දිනපු සුරේන්ද්‍ර පෙරේරායි දායක කරගන්න මම හිතුවා."

"අයියා අහලා ඇතිනේ කරුණාරත්න අබේසේකර මහත්තයා ගේ පුතා, දිලීප අබේසේකර. ඔයාලගෙන් පස්සේ ආනන්ද විද්‍යාලයෙන් බිහිවුණා තවත් නව පරපුරේ ගීත රචකයෙක් දිලීප. ඉතින් මගේ තනුවට පද ලියවාගන්න මම දිලීපව තෝරාගත්තා."

දිවංගත ගේයපද රචක කරුණාරත්න අබේසේකරයන් විවිධාකාර වු පද රචනාවන් කළ ප්‍රවීණයෙක්, ජනප්‍රිය හින්දි ගී තනුවලට පද යොදා සිංහල සිනමාව වෙනුවෙන් කරුණාරත්න අබේසේකරයන් කළ ගී බොහෝ ජනප්‍රිය වුවා.

කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ම බිහිවුණ සහන් සහ දිලීප යන යෞවනයින්ගේ එක් වීම හොඳ සුසංයෝගයක් වේවි.

"මොනවා වුණත් දිලීප මුලින්ම ලියපු පද වැල ඒ තරම් ප්‍රබල වුණේ නෑ. ඔය දවස් වල තමයි සීගිරිය බලන්න ආව විදේශික කාන්තාවකට අතවර කරන්න උත්සාහ කරපු අපේ තරුණයෙක් ගැන ප්‍රවෘත්තිය දිලීපට අහන්න ලැබිලා තියෙන්නෙ. ඉතින් ඒ සිද්ධිය නිමිත්ත කරගෙනයි දිලීප මේ පද ටික දෙවෙනි වතාවටත් ලිව්වේ. දිලීප මේ ගීය හඳුන්වන්නේ "රස්තියාදුකාරයා සහ සීගිරි ලිය" කියලයි. සීගිරි ලලනාවන්ගේ රූපයෙන් උන්මාද වුණ තරුණයෙක් සීගිරිය බලන්න ආව තවත් තරුණියක් අමතන ආකාරයයි, ඒ තරුණිය උත්තර දෙන ආකාරයයි තමා දිලීප මේ විදියට ලියලා දුන්නේ. මේ ගීතය අපේ "ත්‍රී" සංගත තැටියට ඇතුලත් වෙනවා." සහන් රන්වලයන් පිළිසඳර නිමා කළා.

සන්නස මාසිකයේ "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් අප සහන් ට ස්තූතිවන්ත වෙනවා.

තරුණයා :ආලකමන්ද මාලක පන්නා
මෝහන දෑසින් පාලා නුරා - පා නුරා
මා කැඳවනව ද සුරතලියේ
තරුණිය: දහසක් නොනිඳ සිටියත් මුර/ලා
සැඟවී එනව ද කාටත් හොරා - හොරා
මා හා යන්නට හඳ පානේ

තරුණයා: ඇසුවෙන් වරුණා දැකුමට ආවා
බෝ දුර ගෙවා - දුර ගෙවා
කෝ මට මොනව ද දෙන්නේ ?

තරුණිය: ඇසු දුටු පමණට සිහි මොළ සිඳුනද
සිහිගිරි පුරේ - ගිරි පුරේ ?
ලිය - විළිබිය හඳුනන්නේ

තරුණයා: මින් පෙර නුදුටුව නූතන නගරෙට
හා හා පුරා - හා පුරා
කැන්දන් යන්නම් ළඳුනේ

තරුණිය: තව නො බඳිනු මැන අහසට මාළිග
මානම් නොවේ - මා නොවේ
නිරිඳුට පිටුපා යන්නේ

GATEWAY
LAWYERS

▶ Advice on Legal Matters
▶ Business & Commercial Law
▶ Sale of Business
▶ Conveyancing
▶ Powers of Attorney
▶ Wills & Estate Planning
▶ Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia



# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

"ඉරගලත් වැටිලා අහවරයි... බෝ කොහෙවත් නොය.. පෙනේද කලුව පාත් වෙලා තියෙන රඟ.. මොර සූරන්නා වගේ වැහි ගෙඩි රූටයි.. අප්පුච්චත් එක්ක පිලට වෙය.. මම හරි කරපු ගෝන මස් ටිකක් මඩක්කුවට දාලා දෙන්නම්" යි කියාගෙන කොයින් මැණිකා ගෙට විය.

කොයින් මාමා පිලට ආවේ මා ගෙනැවිත් දුන් සැර බීම බෝතලයද රැගෙනය.

"වැස්ස වළාහක දෙවියෝ අපේ අඩෝවැඩියාවට කන්දුන්නා ඕන්.." කියමින් කොයින් මාමා මා අසළ වාඩි විය.

වැස්ස අහවර වුණාම හේන් පුරන හැටි මට විස්තර කරමින් සිටින අතර මහ වැස්ස අතරින් ගැහැනියකගේ කෙඳිරිලි හඬක් මතුවිය. මේ හඬ ඇසෙනවාත් සමගම " මහතැන් ගෙට වෙය.. ගෙට වෙය.." කියමින් මාමා නැගිට ගියත් මා මදකට ප්‍රමාද වුණේ හේන් ඉම කාට හෝ කරදරයක් නම් උදව් කළ යුතුය යන අදහසින්. මා පියවි ලොවට ආවේ මැණිකාගේ ගෝරනාඩුවෙන්.

"ඇස්ගෙඩි දෙක උලුප්පාගෙන ඔටවන් ඉන්නෙ.. ඇතුල් පිලට වෙය.." මමත් අඩියට දෙකට ගෙට වුණා.

කොයින් මැණිකා ගේ ගෝරනාඩුව මට මෙහෙම ඇහුණා.

"තී මේ හේන් ඉම ආගිරි ගාන්නේ තිගේ වාහේ මෙහේ නොව.. බොල දීයන්ට (දුවපිය යන්ට) පරට්ටි.." යි මොනවාදෝ කුටු කුටු ගා කියා ඇගේ ඇඳිවතක් දොරෙහි එල්ලා දැමීය. ඉන් මොහොතකට පසු ඒ ලොමුඩැහැගන්වන කෙඳිරිලි හඬ නෑසී ගියා.

"මොකෑ මාමා ඒ..?" මම කොයින් මාමාට කිට්ටු කරලා ඇහුවා.

"බෝ දන්නෙ නෑ මේ හේන් ඉම ඉන්න අමනුස්සයෝ ගැන.. ඔය ගැබ්බරින් වළපල්ලට දෙරි ගැහුණ එකියකගෙ අවතාරෙ. ඕකට තමා බෝදිලිමා කියන්නේ. ඕකි පිරිමි අපට නපුරයි.. ගෑනුන්ට බය පස්සපාතයි. මැණිකා මොරගානකොට ඒක නොව වහං වුණේ. අද උඹත් ඇතුල් පිලම කදහපං මහතැන්.." කියමින් කොයින් මාමා නැගිටලා ගියා..

බෝගල